ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
Ministry of Digital Economy

1101, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1ඒ, මැද පාර, කොළඹ 02
1101, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A, சென்டர் வீதி, கொழும்பு 02
Unit 1101, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02

/modesrilanka
mode.gov.lk

මගේ අංකය / எனது இல / My No.

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2026/03/16

මාධ්‍ය නිවේදනය.

ඉන්ධන අර්බුදයට විසඳුමක් ලෙසූසෘ ක්‍රමවේදය යළි සක්‍රීය කෙරේ: අනවශ්‍ය කලබලයකින් තොරව සහයෝගය දක්වන ලෙස නියෝජ්‍ය අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක්.

පවතින ගෝලීය දේශපාලනික අර්බුද හමුවේ මෙරට ඉන්ධන සංචිත සුරක්ෂිත කරගැනීම සහ ජනතාවට බාධාවකින් තොරව ඉන්ධන ලබාදීම සඳහා නව QR කේත ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර ඇති බව ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය එරංග වීරරත්න මහතා විශේෂ ප්‍රකාශයක් නිකුත් කරමිනු සඳහන් කළේය. නියෝජ්‍ය අමාත්‍යවරයා අවධාරණය කළේ ලෝක වෙළඳපොළේ ඇති වී තිබෙන අවිනිශ්චිතතාවයන් හමුවේ රටක් ලෙස ඉන්ධන පරිභෝජනය කළමනාකරණය කරගැනීම අත්‍යවශ්‍ය වී ඇති බවයි.

මැදපෙරදිග කලාපයේ හටගෙන ඇති යුද්මය වාතාවරණය හේතුවෙන් ලොව බොහෝ රටවල් සිය ඉන්ධන පරිභෝජනය සීමා කිරීමට පියවර ගෙන ඇති බවත්, පකිස්ථානය වැනි රටවල් දැනටමත් සතියකට දින කිහිපයකට සේවා සීමා කර ඇති බවත් අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. ලංකා ඛනිජ තෙල් නීතිගත සමාගම සතුව ඉදිරි මාස කිහිපයකට ප්‍රමාණවත් ඉන්ධන සංචිත පවතින නමුත්, එම සංචිත අනවශ්‍ය හිඟයකින් තොරව දීර්ඝ කාලයක් පවත්වාගෙන යාම සඳහා ක්‍රමානුකූල බෙදාහැරීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවය ඔහු අවධාරණය කළේය.

ඉන්ධන පිරවුම්හල් අසල අනවශ්‍ය තදබදයක් ඇතිවීම වැළැක්වීම සඳහා QR කේතය හරහා ඉන්ධන ලබාදීමේ වැඩසටහන සති අන්තයක සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. එලෙස සති අන්තයක් තෝරාගත්තේ සතියේ දිනවල ජනතාවට සිදුවන අපහසුතාවයන් අවම කිරීමට බව අමාත්‍යවරයා පැවසීය. මීට පෙර පද්ධතියේ පැවති ගැටලු වන වාහන අයිතිය වෙනස් වීම සහ ජංගම දුරකථන අංක පිළිබඳ ගැටලුවලට පිළියම් යොදා ඇති අතර, පද්ධතියෙන් වාහන ඉවත් කිරීමේ (Deregister) පහසුකම ද දැන් වඩාත් විධිමත් කර ඇත. වාහන අලෙවි කර ඇති පුද්ගලයන්ට සිය ගිණුමෙන් එම වාහන ඉවත් කරන ලෙස ඉල්ලීමක් කළ එතුමා, එවිට අලුතින් මිලදී ගත් පුද්ගලයාට එය ලියාපදිංචි කළ හැකි බවත් හෙතෙම සඳහන් කළේය.

දුරකථන / தொலைபேசி / Telephones +94112334562
ෆැක්ස් / பெக்ஸ் / Fax +94112334576
ඉ-තැපෑල / மின் அஞ்சல் / E-mail info@mode.gov.lk

මෙම වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා ඉන්ධන පිරවුම්හල් සේවකයන් සහ හිමිකරුවන් පුහුණු කිරීමේ කටයුතු අද දිනය ඇතුළත අවසන් කිරීමට නියමිතය. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ තාක්ෂණික කණ්ඩායම් දිවා රාත්‍රී වෙහෙස මහන්සි වී ඉතා කෙටි කලකින් මෙම පද්ධතිය යාවත්කාලීන කර ඇති බව පැවසූ අමාත්‍යවරයා, ආරම්භක අවස්ථාවේදී ඇති විය හැකි සුළු තාක්ෂණික ගැටලු මඟහරවා ගැනීමට අවශ්‍ය සියලු පියවර ගෙන ඇති බවද තහවුරු කළේය.

ඉන්ධන හිඟයක් පිළිබඳ අනවශ්‍ය බියක් ඇති කරගනිමින් පෝලිම් නිර්මාණය නොකරන ලෙසත්, රජය විසින් හඳුන්වා දෙන මෙම විධිමත් කළමනාකරණ ක්‍රියාවලියට උපරිම සහයෝගය ලබා දෙන ලෙසත් නියෝජ්‍ය අමාත්‍ය එරංග වීරරත්න මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියි. හෙට උදෑසන වන විට සියලු තාක්ෂණික බාධාවන් මඟහැරී ජනතාවට පහසුවෙන් සේවාව ලබාගත හැකි වනු ඇතැයි ද අමාත්‍යවරයා වැඩිදුරටත් විශ්වාසය පළ කළේය.

Nipuni Rajapaksha
B.A (UOC). MSSC (UOK).
Media Secretary to the Deputy Minister
Ministry of Digital Economy

නිපුනි රාජපක්ෂ
ගරු, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ
මාධ්‍ය ලේකම්